.**කසුන් කල්හාර** ගී පද එකතුව
සකැසුම ශාන්ත සේනාධීර

.පටුන


ආදර මල් වළ
ආදරණීය වස්සානය
අනන්තයට යන
දෑත විහිදා
දුහුල් වී
එක වසන්තයක්
ඇරඹුමම කදුලක්
හැගුම් මතුවී
කඩුව එපා
කවුළු පියන්පත්
ලිහිනියෙකු සේ
මද සුළගේ
මල් මිටක්
මල් වරුසාවේ
නිලට නිලේ
පමාවී පිපුන
රාත්‍රිය මනරම්
රත්සර කැකුල

[ආදර මල් වළ](#)

ආදර මල් වළ
පාට කියන්නද
ඒ වගෙ ලස්සන තව නෑ//
මී දුම් පිනි පොද
දෑස වසන් කර
සමනල් සිහිනය පිපුනා//

දේදුනු රේඛා
දෑසම තවරා
තවමත් මළ් සිප
බලා සිටිනවා
මීදුම් තවරා සුලගට
ඈතට සගවා තුන් සිත
දෑස හෙරෙන් ඈත සොයනවා
(අදුර මැදින් එන්න සඳ ලියේ)
දේදුනු සායම දෑස ගොමු කර
මාළති යයක හැලිලා//
සීතළ හිම කදු
යාය පිය මැන
දෙව්ලිය සිහිනෙක වැඩියා
දෙව්ලිය සිහිනෙට වැඩියා

ආදරණීය වස්සානය

හීනයකි මට ආදරේ
හැගෙනවා මට ජීවිතේ
හීනයක රඟ ජීවිතේ
හැගෙනවා ඔබෙ ආදරේ

වැටෙන කොට කදුළු ඇවිලිලා
සුවඳ මල් පෙති පරවෙලා
සුවඳ මල් පෙති පරවෙලා
වස්සාන සිහිනේ ඇවිලිලා
සුසුමේ තවරා සැගවූ සිහිනේ//

ආ ආදරණීය වස්සානේ
ආ ආදරණීය වස්සානේ
ආ ආදරණීය වස්සානේ
ආ ආදරණීය වස්සානේ

අනන්තයට යන

අනන්තයට යන

අනන්තයට යන පාර දිගේ//
ඇය එනවා ප්‍රාර්ථනාවේ
ඇය එනවා
හරිත නිම්නයේ සීතළ අතරින් පිනි වැස්සේ
අනන්තයට යන පාර දිගේ//
ඇය එනවා ප්‍රාර්ථනාවේ//
මල් පොකුරු අරන් සීතළ පිනි වැස්සේ//

සීතළ නෑමේ අදුරු රැයේ
මා ඇය තුරුලේ
උනුසුම දැනුනේ ආදරයේ සිහිනේ
මල් පොකුරු අරන් සීතළ පිනි වැස්සේ
හරිත නිම්නයේ සීතළ අතරින්
පිනි වැස්සේ
අනන්තයට යන පාර දිගේ//
ඇය එනවා ප්‍රාර්ථනාවේ//

මල් පොකුරු අරන් සීතළ පිනි වැස්සේ//

කළුවී ගිහින් නිල් අහස් තලේ ඈ නෙතු දැල්වේ
සෙනෙහේ ලදුනේ ජීවිතයේ සිහිනේ
මල් පෙකුරු අරන් සීතළ පිනි වැස්සේ
හරිත නිම්නයේ සීතළ අතරින් පිනි වැස්සේ
අනන්තයට යන පාර දිගේ//

දෑත විහිදා

ඇය එනවා ප්‍රාර්ථනාවේ//
මල් පොකුරු අරන් සීතළ පිනි වැස්සේ//
දෑත විහිදා

දෑත විහිදා ආදරෙන් සිපගන්න
මුළු ලෝකෙම සිනහ නංවා මුව අගින්
සනසන්න
දැවෙනා සිත
දෑත විහිදා ආදරෙන් සිපගන්න
මුළු ලෝකෙම සිනහ නංවා මුව අගින්
සනසන්න
දැවෙනා සිත

රුදුරු ගිනියම් පොලෝ තලේ
සිහිළසක් සොයනා
සිනහ බර දෑස් කල්පනා
මිනිසුනේ
දෑත විහිදා ආදරෙන් සිපගන්න
මුළු ලෝකෙම සිනහ නංවා මුව අගින්
සනසන්න
දැවෙනා සිත
දෑත විහිදා ආදරෙන් සිපගන්න
මුළු ලෝකෙම සිනහ නංවා මුව අගින්
සනසන්න
දැවෙනා සිත

<u>උහුල් වී</u>

පුළුන් වලා රොදක් වගේ
මගේ ආදරේ

උහුල් වෙවී සැහැල්ලුවෙන් පාවෙලා
අනන්තය සොයා තැනක සිතක
ලැගුම් නොගෙන ඔහේ ඇදෙන්නේ
උහුල් වෙවී පුළුන් වළා වගේ ආදරේ
විල් තළයේ <u>සිලිටි</u> මාලේ
රොන් සිඹිනා මුතුපින්නේ
රෑ අහසේ තරු එලියේ
තුරුළු වෙළා නිමේෂයේ
හදිස්සියේ ඔය ලේන්සුවෙන්
මගෙ හිත දවටාගෙන කියාවෙනැහැ කියලා //
නෑ නෑ පුළුන් වළා රොදක් වගේ මගේ ආදරේ

පුළුන් වළා නිසන්සලේ ලැගුම් ගනී කදු ඉවුරේ
සඳ පානේ පිනි වැස්සේ
හඳ උතුරා සිහින ගෙනේ //
හදිස්සියේ <u>හසකැන්</u> වෙනා බොඳ උනාම හැංගිලා යාවි නේද
හොර රහසේ හැංගිලා යාවි නේද
නෑ නෑ පුළුන් වළා කුලක් වගේ මගේ ආදරේ

[එක වසන්තයක්]

එක වසන්තයක එක රාත්‍රියක
දැනුනා මතකයි මට ඉබේම වාගේ
ඔබෙ සුවඳ
එක හුස්මක් වත් ගන්නට ඉඩ නැති තරමට
දැනුනා විතරක් මතකයි
හද ලුහුබැඳ ඉව කරනා
පෙර සසරක සුපුරුදු සුවඳද
ඒ ඔබේ නොවෙද එනමුදු ඒ ඔබමද
ඔබමද ඒ
සොදුර

මේ වසන්තයෙදි හමු වුන සුළඟ සමග
සැඟවී පැහෙන්නට හිතයි මට
ඔබෙ සුවඳ සමග මුසු වනු පිනිස
මගෙ සුසුමක් තියන්නද
සිහිවනු පිනිස සොදුර

මේ වසන්තයම ගතවී යන්නට පෙර
තුරුලේ ඇවිලෙන්නට පතමි මම
ඔබෙ සිතැගි වලට මුසුවනු පිනිස
මගෙ හැගුමක් තියන්නද පිවිසනු පිනිස
සොදුර

එක වසන්තයක එක රාත්‍රියක
දැනුනා මතකයි මට ඉබේම වාගේ
ඔබෙ සුවඳ
එක හුස්මක් වත් ගන්නට ඉඩ නැතිතරමට
දැනුනා විතරක් මතකයි

ඇරඹුමම කදුලක්

ඇරඹුමම කදුලක් වෙලා
මා බලා එද්දී ඒ දිහා
ආ දුරත් දුර නැතිනිසා
අවසානයට පෙර ඈ ගියා
ඇරඹුමම කදුලක් වෙලා ..

දුක් බරම කවියක් ලියා
එක් පද පෙලක් අඩුවෙන් තියා
දුක් බරම කවියක් ලියා
එක් පද පෙලක් අඩුවෙන් තියා
අරුත පසිදින්නට කියා
අවසානයට පෙර ඈ ගියා

ශෝකාන්තය එන තුරා
තව රැදෙන්නට සිත් නැති නියා
ශෝකාන්තය එන තුරා
තව රැදෙන්නට සිත් නැති නියා
අනන්තය ලග මා දමා
අවසානයට පෙර ඈ ගියා

ඇරඹුමම කදුලක් වෙලා
මා බලා එද්දී ඒ දිහා
ආ දුරත් දුර නැතිනිසා
අවසානයට පෙර ඈ ගියා

## හැගුම් මතුවී

හැගුම් මතුවී ඇවිලේ රහසේ
සිත දැහැනින් මා මිදෙනා මොහොතේ
සිතිවිලි මුමුනා කීව දේ දැනුනා
(ඔබේ ළමැදේ සුව යහනේ
නවතින්න හද කොදුරයි)2

සරා සඳ ලෙසින් පායන්න
ඇඟිලි තුඩින් රුැය පුබුදන්න
දෙනෙතින් සරා ගී බැල්මකින් මත්වී
ආදරෙන් ලංවී හැගුම් මතුවී
ඇවිලේ රහසේ
සිත දැහැනින් මා මිදෙනා මොහොතේ
සිතිවිලි මුමුනා
කීව දේ දැනුනා
(ඔබේ ළමැදේ සුව යහනේ
නවතින්න හද කොදුරයි)2

දෙතොල් පෙති සෙමින් සිප ගන්න
සුසුම් වරලසේ හංගන්න
ගිනිදැල් ගත බැදේ
ඔබෙ පහසින් මිදේ
සෙනෙහස එහිතිබේ
හැගුම් මතුවී ඇවිලේ රහසේ
සිත දැහැනින් මා මිදෙනා මොහොතේ
සිතිවිලි මුමුනා කීව දේ දැනුනා
(ඔබේ ළමැදේ සුව යහනේ
නවතින්න හද කොදුරයි)2

[කඩුව එපා]

කඩුව එපා නුඹෙ දෑත දියන් මට
මනමේ කුමාරී
(කෝළ කොමළ මල් දාම සදිසි
නුඹෙ දෑත දියන් සුකුමාරී)2
මනමේ කුමාරී
ඒ ලිය මනමේ කුමාරී

පාටවේ නිල් හීසැර හුරුමට
මේ අදහා ගන්නට බැරිදේකී
ආලනුරා මල් හී මෙතරම්
ඇයි නපුරු කියාපන්
ඒ ලිය මනමේ කුමාරී
(කෝළ කොමළ මල් දාම සදිසි
නුඹෙ දෑත දියන් සුකුමාරී)2
මනමෙ කුමාරී

සීත සදුන් ලාදළු සීතල
නෙක තමර තවරා
හිමින් හිනාවී
දෑත දියන් නුඹෙ කඩුව නොවේ
ලොව දිනන්න කුමාරී
ඒ ලිය මනමෙ කුමාරී
(කෝළ කොමළ මල් දාම සදිසි
නුඹෙ දෑත දියන් සුකුමාරී)2
මනමෙ කුමාරී

කවුළු පියන්පත්

(කවුළු පියන්පත් වහන්න සඳළු තලාවේ
ඔබ දුරයි නෙතට මා සිටිනා ලවැලි තලාවේ)2

විලක දුරක මල් පිපුනේ අපට නොවේ මැයි
ඔරු පාරු ඇවිත් බලා යාවි විල් දිය ගැඹුරුයි
මල් සුවඳ උරා ඇදී යන්නේ බමරුන් කෝමැයි
සඳළුතලාවට පැල්පත දුරනම් බොමැයි

කවුළු පියන්පත් වහන්න සඳළු තලාවේ
ඔබ දුරයි නෙතට මා සිටිනා ලවැලි තලාවේ

කිරි සිනා සලන සඳවත අහසෙම රැඳුනාවේ
ඉගි මරන සඳකැළුම් අහසට නොම පෙනුනා වේ
සිත ඈත අරන් යන විමනේ සඳළු තලාවේ
කව්ළු පියන් වසනු මැනවි නෙතුකැන් හමුවේ

(කවුළු පියන්පත් වහන්න සඳළු තලාවේ
ඔබ දුරයි නෙතට මා සිටිනා ලවැලි තලාවේ)2

## ලිහිනියෙකු සේ

ලිහිනියෙකු සේ සිතුමතින් පාවී
අහසට නැගී ඉහළ ඉගිලෙමී
දුර පාවෙනා වළාවේ කිමිදිලා
ඉගිලී යමී ආකාසේ නිම තුරා
ඔබ නිසා සුළඟවී
ඔබ මගේ ලග නිසා

නිම් හිම් නැති සිහිනයක් දකිමී
රෑ සඳ පහන් මංසලේ නැවතී
තරු මාවතේ දිගන්තේ සැරිසරා
ඉගිලී යමී ආකාසේ නිම තුරා
ඔබ නිසා සුළඟවී
ඔබ මගේ ලග නිසා

[මද සුළගේ](#)

මද සුළගේ පාවී
සඳට ළංව හිරුට ළංව
දැවටි දැවටි
වළාකුලක් වී නිල් අහසේ
ඉන්න නිදහසේ

ඉමක් නොමැති තරු කැට ලග
නතර වී දුක සැප බලන්න
අනන්තයට ඇවිද යන්න //
මද සුළගේ පාවී
සඳට ළංව හිරුට ළංව
දැවටි දැවටි
වළාකුලක් වී නිල් අහසේ
ඉන්න නිදහසේ

මහ පොලොවේ හැඩ පෙනෙන්න
මිනිසුන් එක ලෙස පෙනෙන්න
සාමයේ අරුනළු
වළාකුල වී පෙනෙන්න ////

## මල් මිටක්

මල් මිටක් තියන්න ඔබ අතේ
මට කියා කොයින්ද මල් වනේ
ජීවිතේ විසල් නදී තෙරේ
තුරුහිසත් මළත් ඔබයි මගේ

සොදුරු කව්ලියාන හිත් කොනේ
තාරුකා බහින රාත්‍රියේ
ගෙල වටේ වෙලී හමා ඇදී
නළ රැලී ඔබයි මගේ

මල් මිටක් තියන්න ඔබ අතේ
මට කියා කොයින්ද මල් වනේ
ජීවිතේ විසල් නදී තෙරේ
තුරුහිසත් මළත් ඔබයි මගේ

තුරුලතා පවා උකෙන් වගේ
අත වනා හොයන්නේ ඔබ කොහේ
හැන්දෑවේ වගේ සෞම්‍යදී නිදා ඉන්න
මගේ හදේ

මල් මිටක් තියන්න ඔබ අතේ
මට කියා කොයින්ද මල් වනේ
ජීවිතේ විසල් නදී තෙරේ
තුරුහිසත් මළත් ඔබයි මගේ

මල් වරුසාවේ

මල් වරුසාවේ පාවී එන්නම්
අදුරේ තරු කැට අතරින්
ඔබ එනවානම්
රැදෙන්නම් සිහිනේ
සීතළ මේ තනිකම නොදැනේ
නිල් ආකාසේ
පාවී එන්නම් //

පිනිදිය විසිරුනු ගං ඉවුරේ
දිය රළ බිදුනේ ගී හඬ සේ
ඔබ මා වූ සිහින පැලේ
සෙනෙහේ දැනුනේ
මල් වරුසාවේ
පාවී එන්නම් //

මල් වරුසාවේ පාවී එන්නම්
අදුරේ තරු කැට අතරින්
ඔබ එනවානම්
රැදෙන්නම් සිහිනේ
සීතළ මේ තනිකම නොදැනේ
(සීතළ මේ තනිකම නොදැනේ )
නිල් ආකාසේ
පාවී එන්නම් //

## නිලට නිලේ

නිලට නිලේ නිල් කැටේට කඩා හැලෙන
ජල කදකට ගීත සදන උල්පත ඔබය
ඒ නිල් ජල කඳ මතුපිට අත්ල තබා හෙමි හෙම්හිට
තාල නගන රළ පෙල ඔබය
නොසිදෙන පෙම් උල්පත ඔබය
බිදෙනා පෙම් රළ පෙල ඔබය

රතට රතේ පිපී වැනෙන නෙළා ගන්න කියා කියන
පුදුම හිතෙන හිත්මළ ඔබය
ඒ හිත්මළ සිඹ සැනසෙන නටු මත කටු ඇතිබව දැන
සුවඳ විදින බඹරිදු ඔබය
පුදුම හිතෙන හිත්මළ ඔබය
සුවඳ විදින බඹරිදු ඔබය

ගිරා නිලට පැසී දිලෙන නෙලා ගන්න කියා කියන
නුරා ගොයම් යායම ඔබය
ඒ නව ගොයමේ කිමිදෙන ළය නියරේ නිති ඇවිදින
සරා සුවද මද නළ ඔබය
නුරා ගොයම් යායම ඔබය
සරා සුවද මද නළ ඔබය

නිලට නිලේ නිල් කැටේට කඩා හැලෙන
ජල කදකට ගීත සදන උල්පත ඔබ
ඒ නිල් ජල කඳ මතුපිට අත්ල තබා හෙමි හෙම්හිට
තාල නගන රළ පෙල ඔබය
නොසිදෙන පෙම් උල්පත ඔබය
බිදෙනා පෙම් රළ පෙල ඔබය

පමාවී පිපුන

පමාවී පිපුනු මල් සුවඳයි //
පිපුනි දෙතැනක එ් නමුත් සුවද ලෙන් ගතු මයි
හිතට හිතැතිව ගලා යන සුළගේ
හිතා ගන්නට බෑ
කුමන මලටද කුමන සුවදට දෝ
හද පියන් පත් හැර දමන්නේ
සිහින නගරේ සිළිටි සඳ එලියේ
දෝර ගලනා මතකයේ
සිනිදු පිනි අග පිපී නැළවෙන මළකි මා
මළකි මා ඔබගේ

සසන් බිම් පෙත තුරු වියන් තුරුලේ
දිය කදුළු ඉවුරේ පිනි කදුළු මත පුදා අරුනත
හුදකලාවට සිනා මුසුකල මලකි මා
මළකි මා ඔබගේ
පමාවී පිපුනු මල් සුවඳයි
පිපුනි දෙතැනක එ් නමුත් සුවද ලෙන් ගතු මයි
එ් මමයි එ් මමයි ඔබට මතකයි නම්
පමාවී පිපුනු මල් සුවඳයි
පිපුනි දෙතැනක එ් නමුත් සුවද ලෙන් ගතු මයි
එ් මමයි එ් මමයි ඔබට සිතුනා නම්
කුමන මලටද කුමන සුවදට දෝ
හද පියන් පත් හැර දමන්නේ

රාත්‍රිය මනරම්

රාත්‍රිය මනරම් ආ අ .. අ.. අ .. අ
ඔබ ළඟ හිඳින මි.. මි.. මි..
විට නම්
විඳින්නට හැකිනම් හා ..
ජීවිතය මෙතරම්

දෑස් පිය වෙන විට ඉතින්
යළි අවදිවන්නට ලැබේ දැයි නොදනිමි
දෑස් යට රැඳි සිහින උදුරන් මියෙන්නට පෙර
විඳින්නම් දිවිමල්
විඳින්නයි දිවිමල්

රාත්‍රිය මනරම් .. ..

දෑස් නළියන විට පෙමින්
ඔබ මිසක් කිසිවක් දකින්නට නොපතමි
දෑස් මැද හිඳ පුරුදු උනුහුම්
සුසුම් සුවයෙන් මියෙන්නට හැකිනම්
මියෙන්නට හැකිනම්

රාත්‍රිය මනරම් .. ..

<u>රත්සර කැකුල</u>

රත්සර කැකුල රකින්නම්
ආදරයේ සුවඳ විඳින්නම් ජීවිතයේ
පින්සර පැතුම පතන්නම්
මේ භවයේ එලිය ලබන්නම්
ජීවනයේ

දෙනෝ දහක් අතරේ ආ මග
හිත නතර උනේ ඔබ ළඟ
ඔබ ඇසින් ගලනා ආදර ගඟ
සිහිලැල්ලේ පිහිනා යමි මම

ප්‍රපාතයෙන් නැගෙනා මේ කඳ
නිති අහස උනේ ඔබ වත
රන් රුවන් හැරආ මේ වග
ඔබ ගේම ලොවේදෝ
කිව මැන

රත්සර කැකුල රකින්නම්
ආදරයේ සුවඳ විඳින්නම් ජීවිතයේ